සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023 (2024)

ගිණුම්කරණය	I
கணக்கீடு	I
Accounting	I

33 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා **එහි අංකය ප්‍රශ්නයට ඉදිරියෙන් ඇති කිත් ඉර මත ලියන්න.**
- අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු **අදාළ කිත් ඉරි මත ලියන්න.**
- සෑම ප්‍රශ්නයකටම **සමාන** ලකුණු හිමි වේ.
- **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- **වැඩසටහන් සම්පාදනය කළ නොහැකි ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.**

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

	අත්සන	සංකේත අංක
I වන පරීක්ෂක		
2 වන පරීක්ෂක		
අති.ප්‍රධාන පරීක්ෂක		
ගණිත පරීක්ෂක		
ප්‍රධාන පරීක්ෂක		

I පත්‍රය සඳහා	
ප්‍රශ්න අංකය	ලකුණු
01 - 30	
31 - 50	
එකතුව	

1. පහත දැක්වෙන කුමන ප්‍රකාශය, ගිණුම්කරණයේ මූලික පරමාර්ථය **වඩාත් හොඳින්** විස්තර කරනු ලබයි ද?
   (1) මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගනුදෙනු සටහන් කිරීම
   (2) නෛතික අවශ්‍යතා සපුරාලීම සඳහා පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම
   (3) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ආයතනයක් පිළිබඳ තොරතුරු සැපයීම
   (4) ආයතනයක් පිළිබඳ තොරතුරු එහි කළමනාකරුවන්ගේ භාවිතය සඳහා වාර්තා කිරීම
   (5) ආයතනයක වාර්ෂික බාහිර විගණනය සඳහා මූල්‍ය ප්‍රකාශන මඟින් තොරතුරු සැපයීම (.....)

2. ආයතනයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි, වත්කම් සහ වගකීම්, ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමට පහත කුමන ගිණුම්කරණ සංකල්පය **පදනම්** සපයනු ලබයි ද?
   (1) උපචිත (2) සංගතතා (3) අඛණ්ඩ පැවැත්ම
   (4) ප්‍රමාණාත්මකබව (5) කාලච්ඡේද (.....)

3. කල්බදු ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි භාවිත අයිතිය සහිත වත්කම් හඳුනා ගැනීම සඳහා පහත කුමන ගිණුම්කරණ සංකල්පය **පදනම්** සපයනු ලබයි ද?
   (1) ඒකත (2) සංගතතා (3) කාලච්ඡේද
   (4) යථාරූපී (5) විවක්ෂණ (.....)

- **අංක 4, 5 සහ 6 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

මිහිරි විසින් රු. 500 000 ක මුදලක් හා රු. 400 000 ක් වටිනා ලි බඩු ආයෝජනය කරමින් 2023.01.01 දින වෙළෙඳ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරය මෙදිනම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි කරන ලදි. කෙසේ වුව ද, ගැනුම් මත VAT නොමැති බව උපකල්පනය කරන්න.
පහත ගනුදෙනු 2023 ජනවාරි මාසය තුළදී සිදු විය.

ගනුදෙනු අංකය	දිනය	ගනුදෙනුව
1	01.05	පිරිවැය රු. 400 000 ක් වූ භාණ්ඩ දේශාන් ට්‍රේඩර්ස් වෙතින් ණයට මිල දී ගන්නා ලදි.
2	01.08	දේශාන් ට්‍රේඩර්ස්ගෙන් මිල දී ගත් රු. 30 000 ක භාණ්ඩ ආපසු යවන ලදි.
3	01.15	පිරිවැය රු. 250 000 ක් වූ භාණ්ඩ රු. 345 000 කට අත්පිට මුදලට විකුණන ලදි (රු. 45 000 ක VAT ඇතුළත්ව).
4	01.22	පිරිවැය රු. 100 000 ක් වූ භාණ්ඩ රු. 138 000 කට ණයට විකුණන ලදි (රු. 18 000 ක VAT ඇතුළත්ව).
5	01.25	දේශාන් ට්‍රේඩර්ස්ට ගෙවිය යුතු මුදල පියවීම සඳහා චෙක්පතක් නිකුත් කරන ලදි.

[දැවැති පිටුව බලන්න.

4. ගනුදෙනු අංක **1**, **2** සහ **3** ඒවා සිදු වූ අනුපිළිවෙළ අනුව මිහිරිගේ ව්‍යාපාරයේ පොත්වල සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලාශ්‍ර ලේඛන මොනවා ද?
   (1) ඉන්වොයිසිය, හරපත, ඉන්වොයිසිය
   (2) ඉන්වොයිසිය, බැරපත, ඉන්වොයිසිය
   (3) ඉන්වොයිසිය, හරපත, ලදුපත
   (4) ගෙවීම් වවුචරය, බැරපත, ලදුපත
   (5) ගෙවීම් වවුචරය, ජර්නල් වවුචරය, ලදුපත (.....)

5. මිහිරිගේ **ආරම්භක ආයෝජනය** සහ ගනුදෙනු අංක **3** සහ **5** ඒවා සිදු වූ අනුපිළිවෙළින් සටහන් කිරීම සඳහා භාවිත කරනු ලබන මූලික සටහන් පොත් කවරේ ද?
   (1) මුදල් ලැබීම් ජර්නලය, පොදු ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
   (2) මුදල් ලැබීම් ජර්නලය, පොදු ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය
   (3) පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, විකුණුම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
   (4) මුදල් ලැබීම් ජර්නලය, පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ගෙවීම් ජර්නලය
   (5) පොදු ජර්නලය, පොදු ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය, මුදල් ලැබීම් ජර්නලය (.....)

6. ගනුදෙනු අංක **3** සහ **4** හි ඉද්ධ බලපෑම් පහත කුමන ගිණුම්කරණ සමීකරණයෙන් පෙන්වනු ලබයි ද?

	වත්කම් (රු.'000)	=	වගකීම් (රු.'000)	+	හිමිකම (රු.'000)
(1)	+ 70		+ 63		+ 7
(2)	+ 115		+ 45		+ 70
(3)	+ 133		0		+ 133
(4)	+ 133		+ 45		+ 88
(5)	+ 133		+ 63		+ 70

(.....)

7. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සමඟි පොදු සමාගමේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ලද ලාභය රු. 360 000 ක් විය. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමෙන් පසුව පහත වැරදි අනාවරණය විය.
   - මෝටර් රථ දෙවන වර ප්‍රත්‍යාගණනය කිරීමෙන් වර්ෂය තුළදී ඇති වූ රු. 120 000 ක අතිරික්තය, වෙනත් ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේ වුව ද, මෙම අතිරික්තය ගිණුම්ගත කිරීමේදී මෝටර් රථ වෙනුවෙන් පසුගිය වර්ෂයක හඳුනාගත් ප්‍රත්‍යාගණන හිඟය වූ රු. 80 000 සැලකිල්ලට ගෙන නොතිබුණි.
   - ප්‍රවර්තන වර්ෂයට අදාළ ඡායාපිටපත් යන්ත්‍රයේ නඩත්තු වියදම් වූ රු. 30 000 ක් 2022.04.01 දින ගෙවන ලද අතර එය කාර්යාල උපකරණ ගිණුමට හර කර මුදල් ගිණුමට බැර කර තිබුණි. වර්ෂය සඳහා කාර්යාල උපකරණවල පිරිවැය මත වාර්ෂිකව 20% බැගින් ක්ෂය කර ඇත.

   ඉහත වැරදි නිවැරදි කළ පසු 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **නිවැරදි** ලාභය කොපමණ ද?
   (1) රු. 216 000 (2) රු. 250 000 (3) රු. 256 000
   (4) රු. 290 000 (5) රු. 296 000 (.....)

8. අරුණි ට්‍රේඩර්ස් කේවල ස්වාමි ව්‍යාපාරයකි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී පිරිවැය රු. 20 000 ක් වූ තොගයක් සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර එම අලාභයෙන් 80% ක් රක්ෂණ සමාගම විසින් ප්‍රතිපූර්ණය කරන ලදී. තොග හානිය සහ රක්ෂණ වන්දිය සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් ගිණුම් පොත්වල සිදුකර නොමැත. කෙසේ වුව ද, 2023.03.31 දිනට පැවති භෞතික තොගය මත අවසාන තොගය ආගණනය කර ඇත. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය සහ ශුද්ධ ලාභය පිළිවෙළින් රු. 150 000 ක් සහ රු. 80 000 ක් විය.

   තොග හානිය සහ රක්ෂණ වන්දිය ගිණුම් පොත්වල නිසි පරිදි ගළපා තිබුණේ නම්, නිවැරදි දළ ලාභය සහ ශුද්ධ ලාභය කොපමණ ද?

	දළ ලාභය (රු.)	ශුද්ධ ලාභය (රු.)
(1)	146 000	76 000
(2)	150 000	84 000
(3)	166 000	76 000
(4)	170 000	76 000
(5)	170 000	96 000

(.....)

● **අංක 9 සහ 10 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

නිෂ්පාදන ව්‍යාපාරයක් වන සීමිත අරලිය පොදු සමාගම එහි මෙහෙයුම් කටයුතු 2022.04.01 දින ආරම්භ කරන ලදි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනුවලට අදාළව පහත තොරතුරු දී ඇත.

	වටිනාකම් (රු. මිලියන)
2022.04.01 දින මිල දී ගත් යන්ත්‍රවල පිරිවැය (ඵලදායී ජීවිතකාලය වසර 10 කි).	8 000
මිල දී ගත් අමුද්‍රව්‍යවල පිරිවැය	5 500
සාජු ශ්‍රම පිරිවැය	4 000
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය (යන්ත්‍ර ක්ෂය හැර)	800

අතිරේක තොරතුරු:

- මිල දී ගත් අමුද්‍රව්‍යවලින් 20% ක් 2023.03.31 දිනට තොගය ලෙස ඉතිරිව ඇත.
- 2023.03.31 දිනට නොනිමි තොගය රු. මිලියන 450 ක් විය. නොනිමි තොග ප්‍රාථමික පිරිවැයට අගය කරනු ලබයි.
- රුපියල් මිලියන 550 ක පිරිවැය වූ අමුද්‍රව්‍ය වර්ෂය තුළදී සම්පූර්ණයෙන්ම වියදම් විය.

9. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාථමික පිරිවැය කොපමණ ද?

(1) රු. මිලියන 7 400 (2) රු. මිලියන 7 850 (3) රු. මිලියන 7 950
(4) රු. මිලියන 8 200 (5) රු. මිලියන 8 950 (.....)

10. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු නිෂ්පාදන පිරිවැය කොපමණ ද?

(1) රු. මිලියන 9 000 (2) රු. මිලියන 9 200 (3) රු. මිලියන 9 450
(4) රු. මිලියන 9 550 (5) රු. මිලියන 10 000 (.....)

● **අංක 11 සහ 12 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

කේවල ස්වාමි ව්‍යාපාරයක් වන පියුමි ට්‍රේඩර්ස් එහි ගිණුම් වාර්තා නිසි පරිදි පවත්වාගෙන යොස් නොතිබුණි. මෙම ව්‍යාපාරයට අදාළ තොරතුරු සමහරක් පහත දී ඇත.

	2023.03.31 දිනට (රු.'000)	2022.03.31 දිනට (රු.'000)
දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකමට	5 000	3 000
තොගය	?	1 800
වෙළෙඳ ණයගැතියෝ	1 500	1 000
වෙළෙඳ ණයහිමියෝ	1 200	800

2023.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ මෙහෙයුම් වියදම් රු. 250 000 ක් වර්ෂය තුළදී මුදලින් ගෙවන ලදි. තවද මෙම වර්ෂය තුළදී වෙළෙඳ ණයගැතියන්ගෙන් රු. 3 000 000 ක් එකතු කර ගන්නා ලද අතර, රු. 2 500 000 ක් වෙළෙඳ ණයහිමියන්ට ගෙවන ලදි. සියලු විකුණුම් සහ ගැනුම් ණය පදනමට සිදුකරනු ලබයි. වර්ෂය තුළදී පිරිවැය රු. 2 250 000 ක් වූ උපකරණ මිල දී ගත් අතර, දේපළ, පිරියත සහ උපකරණ ඉවත් කිරීම් සිදු වී නොමැත. පිරිවැය මත 25% ක ලාභයක් සහිතව ආයතනය විසින් භාණ්ඩ විකුණනු ලබයි.

11. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය:

(1) රු. 1 875 000 (2) රු. 2 000 000 (3) රු. 2 100 000
(4) රු. 2 625 000 (5) රු. 2 800 000 (.....)

12. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය සහ 2023.03.31 දිනට තොගය:

	ශුද්ධ ලාභය (රු.'000)	2023.03.31 දිනට තොගය (රු.'000)
(1)	200	1 900
(2)	200	2 075
(3)	375	1 900
(4)	375	2 075
(5)	450	1 900 (.....)

13. 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - සියලු හවුල්කරුවන් ලාභාලාභ සම සමව බෙදා ගැනීමට හිමිකමක් ලබයි.
B - විශ්‍රාම යන හවුල්කරුවකුට, ඔහු/ඇය විශ්‍රාම යන අවස්ථාවේදී ලැබිය යුතු මුදල මත 5% ක වාර්ෂික පොලියක් ලැබීමට අයිතියක් ඇත.
C - සෑම හවුල්කරුවකුටම හවුල් ව්‍යාපාරයේ කළමනාකරණයට සහභාගි විය හැකි නමුත් ඒ සඳහා වේතනයක් ලැබීමට අයිතියක් නොමැත.

(1) A පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (.....)

[අතරවැකි පිටුට බලන්න.

● **අංක 14 සහ 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

පියල්, ලාල් සහ නිල් විසින් ලාභාලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලදී. 2022.04.01 දිනට හවුල් ව්‍යාපාරයේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් ශේෂ පහත පරිදි විය.

	පියල් (රු.'000)	ලාල් (රු.'000)	නිල් (රු.'000)
ප්‍රාග්ධන ගිණුම්	6 000	4 000	2 000
ජංගම ගිණුම් - බැර	800	600	400

හවුල් ව්‍යාපාර ගිවිසුමට අනුව, සෑම හවුල්කරුවකුම රු. 800 000 බැගින් වාර්ෂික වේතනයකට සහ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත 10% ක වාර්ෂික පොලියකට ද හිමිකම් ලබයි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරය රු. 5 100 000 ක පෙට්ටිපත් ලාභයක් වාර්තා කර ඇත. පියල් විසින් හවුල් ව්‍යාපාරයේ ප්‍රවර්තන වර්ෂයේ වියදම් සඳහා රු. 300 000 ක් මුහුණේ පොද්ගලික මුදලින් කෙරී ඇති නමුත් එය හවුල් ව්‍යාපාරයේ පොත්වල ගිණුම්ගත කර නොමැත.

2023.03.31 දින නිල් හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගන්නා ලදී. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 200 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගැළපිය යුතු වේ. මෙදිනට නිල්ට ගෙවිය යුතු මුදල් ණය ගිණුමකට මාරු කරන ලදී. පියල් සහ ලාල් විසින් ලාභාලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරය තවදුරටත් පවත්වා ගැනීමට එකඟ විය.

14. 2023.03.31 දිනට පියල්ගේ ජංගම ගිණුමේ ශේෂය:

(1) රු. 2 200 000 (2) රු. 2 300 000 (3) රු. 2 600 000
(4) රු. 2 900 000 (5) රු. 3 000 000 (.....)

15. නිල්ගේ විශ්‍රාම යෑම සඳහා ගැළපීම් කළ පසු, 2023.03.31 දිනට පියල්ගේ ප්‍රාග්ධන ගිණුමේ ශේෂය සහ නිල්ගේ ණය ගිණුමේ ශේෂය:

	ප්‍රාග්ධන ගිණුම - පියල් (රු.'000)	ණය ගිණුම - නිල් (රු.'000)
(1)	5 800	2 400
(2)	5 800	4 200
(3)	6 400	2 600
(4)	6 400	4 200
(5)	6 600	2 600

(.....)

● **අංක 16 සහ 17 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිමින්ත දමා පොදු සමාගමේ ගිණුම් වාර්තාවලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

	රු.'000
විකුණුම්	4 500
දළ ලාභය	2 100
වෙනත් ආදායම්	600
බදු පෙර ලාභය	1 200
බදු පසු ලාභය	800

2023.03.31 දින මෙම සමාගමේ යන්ත්‍ර දෙවන වරට ප්‍රත්‍යාගණනය කිරීමෙන් රු. 700 000 ක අතිරික්තයක් ඇති විය. මෙම ප්‍රත්‍යාගණනය නොසලකා හරිමින් ප්‍රවර්තන වර්ෂය සඳහා සමාගමේ ලාභය ගණනය කර තිබුණි. මෙම යන්ත්‍ර 2020.03.31 දින ප්‍රථම වරට ප්‍රත්‍යාගණනයෙන් හඳුනාගෙන තිබූ ඌනතාව රු. 300 000 ක් විය.

16. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මුළු ආදායම සහ මුළු වියදම:

	මුළු ආදායම (රු.'000)	මුළු වියදම (රු.'000)
(1)	5 100	3 700
(2)	5 100	3 900
(3)	5 400	4 300
(4)	5 800	3 900
(5)	5 800	4 300

(.....)

17. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වෙනත් විස්තිරණ ආදායම සහ මුළු විස්තිරණ ආදායම:

	වෙනත් විස්තිරණ ආදායම (රු.'000)	මුළු විස්තිරණ ආදායම (රු.'000)
(1)	400	800
(2)	400	1 500
(3)	400	1 800
(4)	700	800
(5)	700	1 200

(.....)

[පස්වැනි පිටුව බලන්න.

18. 'LKAS 2 - තොග' ප්‍රමිතයට අනුව පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

A - තොග පිරිවැය සෑම විටම පිරිවැය සූත්‍රයක් පදනම්ව ගණනය කළ යුතු වේ.
B - ශුද්ධ උපලබ්ධි අගයට තොග කපා හැරීමෙන් ඇතිවන අලාභය, වියදමක් ලෙස එය සිදු වූ කාලච්ඡේදය තුළ හඳුනාගැනේ.
C - සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීම සඳහා පවත්වාගනු ලබන වත්කම් තොග ලෙස සලකනු ලබයි.

(1) A පමණි. (2) C පමණි. (3) A හා C පමණි.
(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (.....)

19. සිමිත ජනක පොදු සමාගම 2022.04.01 දින සංස්ථාපනය කරන ලදී. මෙම සමාගම සම්පූර්ණයෙන්ම සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙන් මූල්‍යනය කර ඇත. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

	රු.'000
අත්පිට විකුණුම්	1 500
ණයට විකුණුම්	3 600
වෙළෙඳ ණයගැතියන්ට ගෙවීම්	1 600
මෙහෙයුම් වියදම්	1 100
ගෙවූ ආදායම් බදු	200

සියලු ගැනුම්, ණය පදනම් මත සිදු කර ඇත.

වර්ෂයේ මෙහෙයුම් වියදම් තුළ රු. 500 000 ක ක්ෂය වියදම් ඇතුළත් විය. 2023.03.31 දිනට වෙළෙඳ ණයගැතියෝ රු. 900 000 ක් විය. 2023.03.31 දිනට ඉදිරියට ගෙවූ වියදම් හෝ උපචිත වියදම් නොතිබුණි.

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතයට අනුව 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය කොපමණ ද?

(1) රු. 1 800 000 (2) රු. 1 900 000 (3) රු. 2 300 000
(4) රු. 3 200 000 (5) රු. 3 900 000 (.....)

20. සිමිත අමා පොදු සමාගම 2020.04.01 දින පිරිවැය රු. 3 600 000 ක් වූ යන්ත්‍රයක් මිල දී ගන්නා ලදී. මෙදිනට යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 8 ක් සහ රු. 400 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. 2022.04.01 දින මෙම යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය සමාලෝචනය කරන ලදී. ඒ අනුව, ආරම්භයේ දී ඇස්තමේන්තු කරන ලද යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය සහ සුන්බුන් අගය පිළිවෙළින් වසර 6 ක් සහ රු. 600 000 ක් ලෙස සංශෝධනය කරන ලදී.

'LKAS 16 - දේපළ, පිරියත සහ උපකරණ' ප්‍රමිතයට අනුව, 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හඳුනාගත යුතු මෙම යන්ත්‍රයේ ක්ෂය වියදම:

(1) රු. 333 333 (2) රු. 366 667 (3) රු. 500 000
(4) රු. 550 000 (5) රු. 700 000 (.....)

21. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමිත සුමුදු පොදු සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා 2023.05.20 දින අධ්‍යක්ෂවරුන් විසින් අනුමත කරන ලදී.

- සමාගමට එරෙහිව ගොනුකර තිබූ නඩුවක් සම්බන්ධයෙන් වන්දියක් ලෙස රු. 600 000 ක් ගෙවන ලෙස 2023.05.01 දින උසාවි නියෝගයක් ලැබුණි. මෙම නඩුව සම්බන්ධයෙන් රු. 800 000 ක වන්දි සඳහා ප්‍රතිපාදනයක් 2023.03.31 දිනට මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගෙන තිබුණි.
- සමාගමේ ණයගැතියකු බුන්වත් වී ඇති බව 2023.05.10 දින ප්‍රකාශයට පත් කරන ලදී. 2023.03.31 දිනට මෙම ණයගැතියාගෙන් ලැබිය යුතු මුදල රු. 600 000 ක් විය.

ඉහත සිද්ධීන් සැලකිල්ලට ගැනීමට පෙර, 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය රු. 3 500 000 ක් විය.

'LKAS 10 - වාර්තාකරණ කාලච්ඡේදයට පසු සිදුවීම්' ප්‍රමිතයට අනුකූල වන පරිදි අදාළ ගැලපීම් කිරීමෙන් පසු, 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි ලාභය කොපමණ ද?

(1) රු. 2 700 000 (2) රු. 3 100 000 (3) රු. 3 300 000
(4) රු. 3 500 000 (5) රු. 3 700 000 (.....)

22. 'LKAS 37 - ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්' ප්‍රමිතයට අනුව, පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ නිවැරදි වේ ද?

A - අසම්භාව්‍ය වත්කම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනා නොගත යුතු ය.
B - අනාගත මෙහෙයුම් අලාභ සඳහා ප්‍රතිපාදන හඳුනා නොගත යුතු ය.
C - අසම්භාව්‍ය වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හඳුනාගනු ලබන්නේ විය හැකි බැඳීමක් ඇති විට පමණි.

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි.
(4) A හා B පමණි. (5) A හා C පමණි. (.....)

[අගවැකි පිටුව බලන්න.

23. සිසිල් බීම නිෂ්පාදනය කරන සමාගමකට අදාළ තොරතුරු පහත දී ඇත.

	රු.'000
2023.01.01 දිනට තොගය	5 500
2023.12.31 දිනට:	
– ජංගම වත්කම්	15 000
– ජංගම වගකීම්	7 500

- ජංගම වත්කම් තුළ තොගය රු. 6 500 000 ක් ද ඉදිරියට කළ ගෙවීම් රු. 2 500 000 ක් ද ඇතුළත්ව ඇත.
- 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය රු. 36 000 000 ක් වේ.

වර්ෂයක් සඳහා වැඩ කරන දින ගණන 360 ක් ලෙස උපකල්පනය කරන්න.

සමාගමේ ක්ෂණික වත්කම් අනුපාතය සහ තොග රැඳවුම් කාලය:

	ක්ෂණික වත්කම් අනුපාතය	තොග රැඳවුම් කාලය (දින)
(1)	0.80	60
(2)	0.80	65
(3)	1.13	60
(4)	1.13	65
(5)	1.25	60

(.....)

24. කළමනාකරණ ගිණුම්කරණ වාර්තා සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - ආයතනයේ අභ්‍යන්තර ඇල්මැති පාර්ශ්වයන් සඳහා කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කරනු ලබයි.

B - කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කිරීමේදී ගිණුම්කරණ ප්‍රමිත අනුගමනය කිරීම අනිවාර්ය නොවේ.

C - කළමනාකරුවන්ට අවශ්‍යතාවයක් ඇති වූ ඕනෑම අවස්ථාවකදී කළමනාකරණ ගිණුම්කරණ වාර්තා පිළියෙල කරනු ලබයි.

D - පුරෝකථනය කරන ලද තොරතුරු පමණක් කළමනාකරණ ගිණුම්කරණ වාර්තා තුළින් සපයනු ලබයි.

(1) B හා C පමණි. (2) A, B හා C පමණි. (3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි. (5) A, B, C හා D යන සියල්ලම ය. (.....)

25. තනි භාණ්ඩයක් පමණක් නිෂ්පාදනය කරන සමාගමක් එහි මෙහෙයුම් 2022.04.01 දින ආරම්භ කරන ලදි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී දරන ලද පිරිවැය පහත පරිදි විය.

ඒකකයක විචල්‍ය පිරිවැය:	රු.
ඍජු අමුද්‍රව්‍ය	90
ඍජු ශ්‍රමය	50
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	60

මුළු ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 1 750 000 ක් විය.

වාර්ෂික නිෂ්පාදනය ඒකක 25 000 ක් වේ.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය:

(1) රු. 200 (2) රු. 240 (3) රු. 270
(4) රු. 298 (5) රු. 338 (.....)

26. නිෂ්පාදන සමාගමක පොදුකාර්ය පිරිවැය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - පොදුවේ දරන ලද නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, පිරිවැය මධ්‍යස්ථානවලට විභජනය කෙරේ.

B - මුළු පිරිවැය සහ මුළු නිෂ්පාදන පිරිවැය අතර වෙනස මුළු පොදුකාර්ය පිරිවැය වේ.

C - යන්ත්‍ර පැය හෝ ශ්‍රම පැය මත පමණක් පදනම්ව පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය ගණනය කරනු ලබයි.

(1) A පමණි. (2) B පමණි. (3) A හා B පමණි.
(4) A සහ C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (.....)

27. නිෂ්පාදිතයක 'පිරිවැය-පරිමා-ලාභ' විශ්ලේෂණය සම්බන්ධයෙන් පහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

A - සමච්ඡේදන ලක්ෂ්‍යයේදී මුළු විකුණුම් වටිනාකම, මුළු ස්ථාවර පිරිවැයට සමාන වේ.

B - සමච්ඡේදන ලක්ෂ්‍යයේදී මුළු විචල්‍ය පිරිවැය සහ මුළු ස්ථාවර පිරිවැය සම්පූර්ණයෙන්ම ආවරණය කර ගැනේ.

C - සමච්ඡේදන මට්ටමෙන් ඔබ්බට විකුණනු ලබන සෑම ඒකකයක් සඳහාම ලැබෙන දායකය සහ ලාභය එකිනෙකට සමාන වේ.

(1) B පමණි. (2) A හා B පමණි. (3) A හා C පමණි.
(4) B සහ C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (.....)

● **අංක 28 සහ 29 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

සමාගමක් විසින් 'A' සහ 'B' යන භාණ්ඩ වර්ග දෙකක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරයි. පළමු මෙහෙයුම් වර්ෂයට අදාළ අයවැයගත තොරතුරු පහත පරිදි වේ.

	'A'	'B'
නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත ඒකක ගණන	8 000	2 000
ප්‍රාථමික පිරිවැය (රු.)	280 000	120 000
ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා අවශ්‍ය ශ්‍රම පැය	5	6

වෙනත් තොරතුරු:

මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	රු. 416 000
මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය	රු. 208 000
මුළු ශ්‍රම පැය ගණන	52 000

නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය සහ නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ශ්‍රම පැය මත අන්තර්ග්‍රහණය කරයි. මුළු පිරිවැය මත 25% ක ලාභයක් එකතු කරමින් භාණ්ඩවල විකුණුම් මිල තීරණය කරනු ලබයි.

28. 'A' භාණ්ඩයේ ඒකකයක ඇස්තමේන්තුගත මුළු නිෂ්පාදන පිරිවැය සහ ඒකකයක මුළු පිරිවැය:

	ඒකකයක මුළු නිෂ්පාදන පිරිවැය (රු.)	ඒකකයක මුළු පිරිවැය (රු.)
(1)	60	76
(2)	75	95
(3)	75	100
(4)	80	95
(5)	80	100

(.....)

29. 'B' භාණ්ඩයේ ඒකකයක ඇස්තමේන්තුගත විකුණුම් මිල:

(1) රු. 75 (2) රු. 135 (3) රු. 144 (4) රු. 165 (5) රු. 176 (.....)

30. ව්‍යාපාරයක් විසින් 'X' සහ 'Y' යන ව්‍යාපෘති දෙක සලකා බලමින් සිටී. එක් එක් ව්‍යාපෘතියේ කාලය වසර 5 බැගින් වේ. පහත තොරතුරු මෙම ව්‍යාපෘති සඳහා අදාළ වේ.

	'X' ව්‍යාපෘතිය (රු.'000)	'Y' ව්‍යාපෘතිය (රු.'000)
යන්ත්‍ර ගැනුම් මිල	8 250	7 525
යන්ත්‍ර ප්‍රවාහන සහ සවිකිරීමේ පිරිවැය	150	125
ආරම්භක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය	250	325
වසර 1 සිට 5 දක්වා ශුද්ධ මුදල් ප්‍රවාහයන්වල වර්තමාන අගය	9 566	?
ශුද්ධ වර්තමාන අගය	?	948

මෙම ව්‍යාපෘති ඇගයීමේදී කළමණාකරුවකු විසින් පහත ප්‍රකාශ සිදු කර ඇත.

A- 'X' ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය රු. 916 000 ක් වේ.

B- 'Y' ව්‍යාපෘතියේ ආරම්භක මුදල් ගලායෑම් රු. 7 650 000 ක් වේ.

C- 'Y' ව්‍යාපෘතියේ වසර 1 සිට 5 දක්වා ශුද්ධ මුදල් ප්‍රවාහයන්වල වර්තමාන අගය රු. 8 923 000 ක් වේ.

මෙම ව්‍යාපෘති සම්බන්ධයෙන් ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ **නිවැරදි** වේ ද?

(1) A පමණි. (2) C පමණි. (3) A හා C පමණි.

(4) B හා C පමණි. (5) A, B හා C යන සියල්ලම ය. (.....)

● **අංක 31 සිට 50 තෙක් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු හිත් ඉරි මත ලියන්න.**

31. 'LKAS 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව පොදු පරමාර්ථ මූල්‍ය ප්‍රකාශනවලට අදාළව පහත එක් එක් ප්‍රකාශ **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය / අසත්‍ය
A - අදාළ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කරයි.	.....
B - තම අවශ්‍යතාවන්ට ගැළපෙන පරිදි තොරතුරු සපයන ලෙස සමාගමට නියම කළ නොහැකි පරිශීලකයන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා පිළියෙල කරයි.	.....
C - ආයතනයක අඛණ්ඩ පැවැත්ම පිළිබඳව කළමනාකාරිත්වයේ තක්සේරුව මත පිළියෙල කරනු ලබයි.	.....
D - ආයතනයක මෙහෙයුම් ප්‍රතිඵලය පිළිබඳ තොරතුරු උපචිත පදනමට මෙන්ම මුදල් පදනමට ද සපයනු ලබයි.	.....

32. මෙලෙඳ ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණයේ දක්වනු ලබන **හිමිකමේ** වටිනාකම් කෙරෙහි පහත එක් එක් ගනුදෙනුවේ **ශුද්ධ බලපෑම** (අගය ද සහිතව) සඳහන් කරන්න.

ගනුදෙනුව	ශුද්ධ බලපෑම වැඩි වේ (I) / අඩු වේ (D) / වෙනස් නොවේ (NC)	අගය (රු.'000) (අදාළ නම්)
A - වර්ෂයට අදාළ රු. 600 000 ක පොලිය ද සහිතව රු. 1 250 000 ක් වූ ණය වාරිකය ගෙවීම	.....	.....
B - ලැයිස්තුගත මිල රු. 2 500 000 ක් වූ භාණ්ඩ 10% ක වෙළෙඳ වට්ටමකට යටත්ව ණයට මිල දී ගැනීම	.....	.....

● **අංක 33 සහ 34 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට පහත තොරතුරු භාවිත කරන්න.**

ව්‍යාපාරයක සියලු මුදල් ගනුදෙනු බැංකු ජංගම ගිණුමක් තුළින් සිදුකරනු ලබයි. 2023 දෙසැම්බර් මාසය සඳහා මෙම ව්‍යාපාරයේ මුදල් ගිණුමෙන් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

	රු.'000
2023.12.01 දිනට මුදල් ගිණුමේ ශේෂය (හර)	200
2023.12.31 දිනට මුදල් ගිණුමේ ශේෂය (හර)	800

2024.01.04 දින ලද 2023 දෙසැම්බර් මාසය සඳහා බැංකු ප්‍රකාශනයේ සාරාංශය:

	රු.'000
2023.12.01 දිනට බැර ශේෂය	200
උපලබ්ධි වූ මුළු චෙක්පත්	2 200
ගෙවීම් සඳහා ඉදිරිපත් කළ මුළු චෙක්පත්	1 500
සෘජු ප්‍රේෂණ (ආයෝජන ආදායම)	300
ස්ථාවර නියෝග ගෙවීම් - ණය වාරිකය (රු. 30 000 ක පොලිය ද ඇතුළත්ව)	50
2023.12.31 දිනට ශේෂය	?

සෘජු ප්‍රේෂණ සහ ස්ථාවර නියෝග ගෙවීම් මුදල් ගිණුමේ සටහන් කරනු ලබන්නේ බැංකු ප්‍රකාශනය ලැබුණු පසුව ය. තවද, ගනුදෙනුකරුවකුගෙන් ලැබී බැංකුවේ තැන්පත් කරන ලද රු. 200 000 ක චෙක්පතක් අගරු වී ඇත. මෙම අගරු වූ චෙක්පත සම්බන්ධයෙන් කිසිදු ගැළපීමක් ගිණුම් පොත්වල සිදුකර නොමැත.

33. පහත දෑ හඳුනාගන්න:

2023.12.31 දිනට:	**වටිනාකම (රු.'000)**	**ශේෂය (හර/බැර)**
(අ) බැංකු ප්‍රකාශනයේ ශේෂය	.....	.....
(ආ) මුදල් ගිණුමේ සංශෝධිත ශේෂය	.....	.....

34. පහත දෑ සටහන් කිරීම සඳහා ද්විත්ව සටහන් ලියන්න (*සංලක්ෂ්‍යය අවශ්‍ය නොවේ.*):

විස්තරය	හර (රු.'000)	බැර (රු.'000)
(අ) රු. 200 000 ක චෙක්පත අගරු වීම:		
(ආ) ස්ථාවර නියෝග ගෙවීම් - රු. 50 000 ක් වූ ණය වාරිකය (රු. 30 000 ක පොලිය ද ඇතුළත්ව):		

35. **වඩාත් උචිත** ගිණුම්කරණ සංකල්ප භාවිත කරමින් පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - ආයතනයක මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් සහ ණයහිමියන් හඳුනාගැනීම සඳහා ..... සංකල්පය පදනම් සපයනු ලබයි.

B - කොටස් හිමියන්ට ගෙවූ ලාභාංශ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ ලාභ බෙදාහැරීමක් ලෙස ඉදිරිපත් කරනු ලබන්නේ ..... සංකල්පයට අනුව ය.

C - කාලය හෝ වටිනාකම් අවිනිශ්චිත වන වගකීම් සඳහා ප්‍රතිපාදන හඳුනාගැනීමට ..... සංකල්පය පදනම් සපයනු ලබයි.

D - සාධාරණ අගයට දේපළ, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීම, ... සංකල්පයෙන් බැහැර වන අවස්ථාවකට උදාහරණයක් වේ.

36. නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළව පහත වගන්ති/සමීකරණ සම්පූර්ණ කරන්න.

A ගින්නක් නිසා හානි වූ අමුද්‍රව්‍යවල පිරිවැය ..... ප්‍රකාශනයෙහි හඳුනාගැනේ.

B නොනිමි තොගය ..... පිරිවැය හෝ මුළු නිෂ්පාදන පිරිවැය මත අගය කරනු ලබයි.

C ආරම්භක අමුද්‍රව්‍ය තොගය + මිල දී ගත් අමුද්‍රව්‍ය - අවසාන අමුද්‍රව්‍ය තොගය = ...

D ආරම්භක නිමි භාණ්ඩ තොගය + මුළු නිෂ්පාදන පිරිවැය - අවසාන නිමි භාණ්ඩ තොගය = ...

37. සමගි ක්‍රීඩා සමාජයේ 2023.01.01 දිනට සාමාජිකයින් සංඛ්‍යාව 300 ක් විය. එක් සාමාජිකයකුගේ මාසික සාමාජික ගාස්තුව රු. 1 000 ක් වේ. සාමාජික මුදල්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

2023.01.01 දිනට කලින් ලද සාමාජික මුදල්	රු. 30 000
2023.01.01 දිනට හිඟහිටි සාමාජික මුදල්	රු. 40 000

2023.01.01 දිනට හිඟහිටි සාමාජිකයින් 30 දෙනෙකු විය. ඔවුන්ගෙන් සාමාජිකයින් 20 දෙනෙකු 2022 දෙසැම්බර් මාසය සඳහා හිඟහිටි සාමාජික මුදලත්, ප්‍රවර්තන වර්ෂයට අදාළ සම්පූර්ණ සාමාජික මුදලත් 2023 වර්ෂය තුළදී ගෙවා තිබුණි. ඉතිරි හිඟහිටි සාමාජිකයින් 10 දෙනා, 2022 වර්ෂයේ අවසාන මාස දෙක සඳහා හිඟ මුදල සහ 2023 වර්ෂයට අදාළ සම්පූර්ණ සාමාජික මුදල ද 2023.12.31 දින දක්වා ගෙවා නොතිබුණි.

2023.01.01 දිනට කලින් ලද සාමාජික මුදල් සියල්ල 2023 වර්ෂයට අදාළ වේ.

අනෙක් සියලු සාමාජිකයින් ඔවුන්ගේ සාමාජික මුදල් නිසි පරිදි ගෙවා තිබුණි.

පහත දෑ හඳුනාගන්න:

(අ) 2023.12.31 දිනට ලැබිය යුතු සාමාජික මුදල් (රු.'000) : .....

(ආ) 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී ලද මුළු සාමාජික මුදල් (රු.'000) : .....

38. හවුල් ව්‍යාපාරයකට අදාළව පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද **(T)** **අසත්‍ය** ද **(F)** යන්න සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය / අසත්‍ය
A - ලිඛිත ගිවිසුමක් නොමැතිව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යා නොහැකි ය.	.....
B - හවුල් ව්‍යාපාරයක සිටිය හැකි උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව 20 දෙනෙකුට සීමා කර ඇත්තේ 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව ය.	.....
C - හවුල් ව්‍යාපාරයක කිර්තිනාමය ගළපනු ලබන්නේ නව හවුල්කරුවකු ඇතුළත් කර ගන්නා අවස්ථාවකදී පමණි.	.....
D - 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව හවුල්කරුවන් විසින් ප්‍රාග්ධනයට අතිරේකව මවුන් ලබාදී ඇති ණය සඳහා 5% ක වාර්ෂික පොලියක් ලැබීමට හිමිකම් ලබයි.	.....

39. රවි සහ සඳුන් ලාභාලාභ සම සමව බෙදාගනිමින් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබයි. පහත තොරතුරු හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්වලින් උපුටා ගන්නා ලදි.

	රවි (රු.'000)	සඳුන් (රු.'000)
2022.04.01 දිනට ශේෂය (බැර)	3 000	2 000
හවුල්කරුවන්ගේ වේතන	1 400	1 200
හවුල්කරුවන්ට ගෙවූ වේතන	(1 000)	(1 000)
ප්‍රාග්ධනය මත පොලිය	800	400
ලාභ කොටස	?	?
2023.03.31 දිනට ශේෂය (බැර)	5 100	3 500

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත දැ හඳුනාගන්න:

(අ) රවිගේ ලාභ කොටස (රු.'000) : .....

(ආ) සඳුන්ට විසර්ජනය කරන ලද මුළු ලාභය (රු.'000) : .....

(ඉ) හවුල් ව්‍යාපාරයේ ලාභය (රු.'000) : .....

40. මූල්‍ය වාර්තාකරණයේ සංකල්පනාත්මක රාමුවට (2018) අනුව පහත වගන්ති සම්පූර්ණ කරන්න.

A - මූල්‍ය ප්‍රකාශන සාමාන්‍යයෙන් පිළියෙල කරනු ලබන්නේ ..... උපකල්පනය මත ය.

B - ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමේ භව්‍යතාව සඳහා ඇති අධිතිය ..... ලෙස නිර්වචනය කෙරේ.

C - මිනුම්කරණ පදනමක් තෝරාගැනීමේදී සලකා බලන සාධක දෙක වන්නේ ..... සහ ..... වේ.

41. සීමිත පොදු සමාගමක සාමාන්‍ය කොටස්වලට අදාළව පහත එක් එක් ප්‍රකාශය **සත්‍ය** ද (T) **අසත්‍ය** ද (F) යන්න සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය / අසත්‍ය
A - හිමිකම් කොටස් නිකුතුව සමාගමේ හිමිකම සහ වත්කම් යන දෙකෙහිම වැඩිවීමට හේතු වේ.	.....
B - කොටස් නිකුතුවකදී අයදුම්පත් සමඟ ලද මුදල් සාජුවම කොටස් ප්‍රාග්ධන ගිණුමට බැර කරනු ලබයි.	.....
C - කොටස් විභජනය සෑම විටම සමානුපාතික විභජන ක්‍රමය මත සිදුකළ යුතු ය.	.....
D - සංචිත ප්‍රාග්ධනිත කිරීම, සමාගමේ කොටස් හිමියන් සංඛ්‍යාව වැඩිවීමට හේතු වේ.	.....

42. 2023 මාර්තු මාසය සඳහා ඇඟලුම් නිෂ්පාදන සමාගමක භාවිත කරන ලද අමුද්‍රව්‍යයක් (කපුරෙදි) සඳහා පහත තොරතුරු අදාළ වේ.

දිනය	විස්තරය
01	ආරම්භක තොගය - මීටර් 500 (මීටරයක ගැනුම් මිල රු. 2 000 කි.)
10	කර්මාන්තශාලාවට නිකුත් කිරීම් - මීටර් 300
20	මිල දී ගැනීම් - මීටර් 400 ක් මීටරයක් රු. 2 500 බැගින්
31	කර්මාන්තශාලාවට නිකුත් කිරීම් - මීටර් 360

'LKAS 2 - තොග' ප්‍රමිතයට අනුව පහත එක් එක් පිරිවැය සූත්‍ර ක්‍රමය යටතේ 2023.03.31 දිනට මෙම අමුද්‍රව්‍යයේ තොග පිරිවැය කොපමණ ද?

(අ) පෙර-පිවිසි පෙර-පිට ක්‍රමය (FIFO) අනුව පිරිවැය (රු.'000) : .....

(ආ) භරිත සාමාන්‍ය පිරිවැය ක්‍රමය (WAC) අනුව පිරිවැය (රු.'000) : .....

43. 'LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස්වීම් සහ වැරදි' ප්‍රමිතයට අනුව පහත එක් එක් අවස්ථාව **ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් වීමක්** ද **ගිණුම්කරණ ඇස්තමේන්තු වෙනස් වීමක්** ද යන්න සඳහන් කරන්න.

අවස්ථාව	ප්‍රතිපත්ති වෙනස්වීමක් / ඇස්තමේන්තු වෙනස්වීමක්
A - ක්ෂය ක්‍රමය, සරල මාර්ග ක්‍රමයේ සිට හිනවන ශේෂ ක්‍රමයට වෙනස් කිරීම	.....
B - දේපළ, පිරියත හා උපකරණ මිනුම් කිරීමේ ක්‍රමය, පිරිවැය ආකෘතියේ සිට ප්‍රත්‍යාගණන ආකෘතියට වෙනස් කිරීම	.....
C - ක්ෂය කළ හැකි වත්කමක ඵලදායී ජීවිතකාලය වෙනස් කිරීම	.....
D - තොග පිරිවැය මිනුම් කරන සූත්‍රය භරිත සාමාන්‍ය පිරිවැය (WAC) ක්‍රමයේ සිට පෙර-පිවිසි පෙර-පිට (FIFO) ක්‍රමයට වෙනස් කිරීම	.....

[ඵකාගළාස්වැනි පිටුව බලන්න.

44. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන සමාගමක ගිණුම් පොත්වලින් පහත තොරතුරු උපුටා ගන්නා ලදී.

	රු.'000
දිගුකාලීන ණය	12 000
වර්ෂය සඳහා පොළී වියදම්	1 200
වර්ෂය සඳහා ආදායම් බදු වියදම්	800

ප්‍රවර්තන වර්ෂය සඳහා හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය සහ ණය හිමිකම් අනුපාතය පිළිවෙළින් 20% ක් සහ 60% ක් ලෙස ගණනය කර ඇත.

පහත දැ හඳුනාගන්න:

(අ) 2023.03.31 දිනට හිමිකම් (රු.'000) : .....

(ආ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය (රු.'000) : .....

(ඉ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පොළී ආවරණ අනුපාතය (වාර) : .....

45. පහත තොරතුරු සමාගමක නිෂ්පාදන ක්‍රියාවලියේදී භාවිත කරන අමුද්‍රව්‍යයකට අදාළ වේ.

වාර්ෂික ඉල්ලුම	ඒකක 120 000
එක් ඇණවුම්ක ප්‍රමාණය ඒකක 3 000 ක් වන්නේ නම් වාර්ෂික ඇණවුම් පිරිවැය	රු. 60 000
ඒකකයක වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය	රු. 10

පහත දැ හඳුනාගන්න:

(අ) ආර්ථික ඇණවුම් ප්‍රමාණය (EOQ) (ඒකක) : .....

(ආ) වරකට EOQ ඇණවුම් කරන්නේ නම් මුළු වාර්ෂික රඳවාගැනීමේ පිරිවැය (රු.) : .....

46. සීමිත අමර පොදු සමාගම නිෂ්පාදන ව්‍යාපාරයක් වේ. ඒකක 25 000 ක මෙහෙයුම් ධාරිතා මට්ටමේදී එහි පිරිවැය තොරතුරු පහත දී ඇත.

- මුළු පිරිවැය රු. 7 500 000
- මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 2 500 000
- මුළු විචල්‍ය පිරිවැය, මුළු පිරිවැයෙන් 60% කට සමාන වේ.
- ප්‍රාථමික පිරිවැය සමන්විත වන්නේ විචල්‍ය පිරිවැයෙන් පමණි.
- ඒකකයක් සඳහා විචල්‍ය පොදුකාර්ය පිරිවැය රු. 70 ක් වේ.
- ඒකකයක් සඳහා විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය රු. 40 ක් වේ.

පහත දැ හඳුනාගන්න:

(අ) ඒකකයක් සඳහා ප්‍රාථමික පිරිවැය (රු.) : .....

(ආ) මුළු නිෂ්පාදන පිරිවැය (රු.'000) : .....

(ඉ) මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය (රු.'000): .....

47. ආයතනයක් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩයක් සඳහා භාවිත කරන 'A', 'B' සහ 'C' යන අමුද්‍රව්‍ය තුන සඳහා පහත තොරතුරු අදාළ වේ.

	A	B	C
ඒකකයක් සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය (කිලෝ ග්‍රෑම්)	10	8	6
යළි ඇණවුම් ප්‍රමාණය (කිලෝ ග්‍රෑම්)	20 000	15 000	20 000
යළි ඇණවුම් මට්ටම (කිලෝ ග්‍රෑම්)	?	24 000	15 000
පොරොත්තු කාලය (සති):			
අවම	2	4	3
උපරිම	4	6	5

මෙම භාණ්ඩයේ සතියක නිෂ්පාදනය ඒකක 300 සිට 500 දක්වා පරාසයේ විචලනය වේ.

පහත දැ හඳුනාගන්න:

(අ) 'A' අමුද්‍රව්‍යයේ යළි ඇණවුම් මට්ටම (කිලෝ ග්‍රෑම්) : .....

(ආ) 'B' අමුද්‍රව්‍යයේ උපරිම තොග මට්ටම (කිලෝ ග්‍රෑම්): .....

(ඉ) 'C' අමුද්‍රව්‍යයේ අවම තොග මට්ටම (කිලෝ ග්‍රෑම්) : .....

[දොළොස්වැනි පිටුව බලන්න.

48. පහත තොරතුරු නිෂ්පාදන ආයතනයක වේතනවලට අදාළ වේ.

- එක් සේවකයෙකු සඳහා මාසික සම්මත නිෂ්පාදනය ඒකක 800 ක් වේ.
- සම්මත නිෂ්පාදන මට්ටම දක්වා ඒකකයක් සඳහා එක් සේවකයෙකුට රු. 100 ක් ගෙවනු ලැබේ.
- සම්මත නිෂ්පාදන මට්ටම ඉක්මවා නිෂ්පාදනය කරනු ලබන සෑම ඒකකයක් සඳහාම රු. 120 ක් ගෙවනු ලැබේ.
- 2023 ජනවාරි මාසය සඳහා සේවකයන් දෙදෙනෙකුගේ සත්‍ය නිෂ්පාදනය:

සේවක අංකය	සත්‍ය නිෂ්පාදනය (ඒකක)
001	950
002	800

- මෙම ආයතනයේ ගබඩා භාරකරු (සේවක අංක 003) සඳහා දිනකට රු. 1 000 ක් ගෙවනු ලබන අතර, මහු දෛනික පදනම් මත 2023 ජනවාරි මාසයේදී දින 25 ක් වැඩ කරන ලදී.
- එක් සේවකයෙකු සඳහා රු 5 000 බැගින් මාසික ප්‍රවාහන දීමනාවක් ගෙවනු ලැබේ.

2023 ජනවාරි මාසය සඳහා මෙම ආයතනයේ පහත දෑ හඳුනාගන්න:

(අ) මුළු ශ්‍රම පිරිවැය (රු.) : .....

(ආ) මුළු සාජු ශ්‍රම පිරිවැය (රු.) : .....

(ඉ) මුළු වක්‍ර ශ්‍රම පිරිවැය (රු.) : .....

49. සමාගමක් තනි භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කරමින් සිටියි. 2024 ජනවාරි සහ පෙබරවාරි මාස සඳහා පහත ඇස්තමේන්තු පිළියෙල කර ඇත.

	ජනවාරි	පෙබරවාරි
ප්‍රාථමික පිරිවැය (රු.)	480 000	600 000
මුළු පොදුකාර්ය පිරිවැය (රු.)	520 000	600 000
නිෂ්පාදනය (ඒකක)	8 000	10 000

අතිරේක තොරතුරු:

- මෙම භාණ්ඩයේ සියලු ප්‍රාථමික පිරිවැය, විචල්‍ය පිරිවැය වේ.
- මුළු පොදුකාර්ය පිරිවැය තුළ විචල්‍ය සහ ස්ථාවර පොදුකාර්ය පිරිවැය යන දෙකම ඇතුළත් වේ.
- මෙම කාල සීමාව තුළ, ස්ථාවර පොදුකාර්ය පිරිවැය නොවෙනස්ව පවති.
- ඒකකයක ඇස්තමේන්තුගත විකුණුම් මිල රු. 125 ක් වේ.

පහත දෑ හඳුනාගන්න:

(අ) ඒකකයක් සඳහා විචල්‍ය පිරිවැය (රු.) : .....

(ආ) දායක විකුණුම් අනුපාතය : .....

(ඉ) සමච්ඡේදන ලක්ෂ්‍යය (ඒකක) : .....

50. සමාගමක් විසින් යන්ත්‍රයක් මිල දී ගැනීමට සලකා බලමින් සිටියි. මෙම යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය වසර 5 කි. මෙම යන්ත්‍රයේ ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහයන් පහත දී ඇත.

	රු.'000
යන්ත්‍රයේ ගැනුම් පිරිවැය	8 250
ආරම්භයේ දී යන්ත්‍රය සඳහා අවශ්‍ය වන කාරක ප්‍රාග්ධනය	1 000
වාර්ෂික ශුද්ධ මුදල් ගලාඒම්	3 300
යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය අවසානයේ සුන්බුන් අගය	1 250

යන්ත්‍රයේ ඵලදායී ජීවකාලය අවසානයේදී කාරක ප්‍රාග්ධනය අයකර ගත හැකි ය. සරල මාර්ග ක්‍රමය මත යන්ත්‍රය ක්ෂය කරනු ලබයි.

යන්ත්‍රය සඳහා පහත දෑ හඳුනාගන්න:

(අ) පිළිගෙවුම් කාලය (වසර) : .....

(ආ) 5 වන වර්ෂයේ : .....

(ඉ) ගිණුම්කරණ ප්‍රෘ : .....

සියලු ම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව இலங்கைப் பரீட்சைத் திணைக்களம் Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2023(2024)
General Certificate of Education (Adv. Level) Examination, 2023(2024)

ගිණුම්කරණය	II
கணக்கீடு	II
Accounting	II

33 S II

පැය තුනයි மூன்று மணித்தியாலம் *Three hours*	අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள் Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදාගන්න.

වැඩසටහන් සම්පාදකය සඳ නොගැසී ගණක යන්ත්‍ර භාවිතයට අවසර දෙනු ලැබේ.

උපදෙස්:
- **පළමුවන** හා **දෙවන** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **පහසුව** පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම පිළිතුරු ලිවීම **අලුත් කඩදාසියකින්** ආරම්භ කරන්න.
- අදාළ පෙරවැඩ, පිළිතුරු පත්‍රය සමඟ අමුණන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු **200** ක් හිමි වේ.

1. සිමින රුවිනි පොදු සමාගම නිෂ්පාදන සමාගමක් වන අතර එය තනි භාණ්ඩයක් නිපදවයි. 2023.03.31 දිනට එහි සාරාංශගත ශේෂ පිරික්සුම් පහත දී ඇත.

විස්තරය	හර (රු.'000)	බැර (රු.'000)
දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැය	85 000	
2022.04.01 දිනට සමුච්චිත ක්ෂය		12 500
භාවිත අයිතිය සහිත වත්කම් - කාර්යාල ගොඩනැගිල්ල	21 000	
කල්බදු වගකීම - කාර්යාල ගොඩනැගිල්ල		21 000
මෝටර් රථය විකිණීමෙන් ලද ලාභය		600
විකුණුම්		75 900
විකුණුම් පිරිවැය	45 200	
තොග - අමුද්‍රව්‍ය	600	
- නිම් භාණ්ඩ	3 600	
වෙනත් ආදායම්		2 200
වෙළෙඳ ලැබිය යුතු දෑ	9 150	
වෙළෙඳ ගෙවිය යුතු දෑ		6 500
මුදල් සහ මුදල් සමාන දෑ	300	
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්		40 000
2022.04.01 දිනට රඳවාගත් ඉපැයුම්		24 000
ඛෙදාහැරීමේ පිරිවැය	8 900	
පරිපාලන වියදම්	7 500	
වෙනත් වියදම්	1 000	
මූල්‍ය පිරිවැය	500	
ගෙවූ ආදායම් බදු	1 100	
2022.04.01 දිනට ආදායම් බදු සඳහා ප්‍රතිපාදන		350
2022.04.01 දිනට වගකීම් සහනික සඳහා ප්‍රතිපාදන		800
	183 850	183 850

(දෙවැනි පිටුව බලන්න.

අතිරේක තොරතුරු:

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සිදුකිරීමට පෙර පහත තොරතුරු සැලකිල්ලට ගත යුතු වේ.

(i) ප්‍රාචර්තන වර්ෂය තුළදී භාණ්ඩ ඒකක 10 000 ක් නිෂ්පාදනය කරන ලදී. මෙම ඒකකවලින් 10% ක් 2023.03.31 දිනට තොවිකිණී තිබූ අතර ඒවා අවසාන තිමි ගාණ්ඩ තොගය ලෙස දක්වා ඇත. ශේෂ පිරිස්තුම් දක්වා ඇති විකුණුම් පිරිවැය සහ අවසාන තිමි භාණ්ඩ තොගයේ පිරිවැය ගණනය කිරීමේදී ගාණ්ඩ නිෂ්පාදනයට අදාළ ක්ෂය සැලකිල්ලට ගෙන නොමැත. මෙම ව්‍යාපාරයෙහි නොනිමි නොග තොමැති බව උපකල්පනය කරන්න.

(ii) සමාගම සතුව තිබූ මෝටර් රථය 2022.04.01 දින රු. 4 000 000 කට මිලකුණන ලද අතර, එයින් රු. 600 000 ක ලාභයක් ඇති විය. මෙදිනට මෙම මෝටර් රථයේ සමුච්චිත ක්ෂය රු. 2 100 000 ක් විය. මෙම විකිණීම නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(iii) ශේෂ පිරිස්තුම තුළ දක්වා ඇති දේපළ, පිරියත සහ උපකරණ, සහ ඒවායේ සමුච්චිත ක්ෂයවල සංයුතිය, එම වත්කම්වල ඵලදායී ජීවකාලය ද සමග පහත දී ඇත. (මෙම තොරතුරු සපයා ඇත්තේ ඉහත (ii) හි දක්වා ඇති මෝටර් රථය විකිණීම ගිණුම්ගත කිරීමෙන් පසුව ය.)

විස්තරය	2023.03.31 දිනට පිරිවැය (රු.'000)	2022.04.01 දිනට සමුච්චිත ක්ෂය (රු.'000)	ඵලදායී ජීවකාලය (වසර)
ඉඩම	7 000	–	–
කර්මාන්තශාලා ගොඩනැගිල්ල	28 000	5 000	14
නිෂ්පාදන පිරියත	38 000	4 000	7
කාර්යාල උපකරණ	12 000	3 500	5
	85 000	12 500	

ගැළපුම් (ii), (iv) සහ (v) හි දක්වා ඇති දැවලට අමතරව වෙනත් දේපළ, පිරියත සහ උපකරණ මිල දී ගැනීම්, ඉවත් කිරීම් හෝ ප්‍රත්‍යාගණනය කිරීම් වර්ෂය තුළදී සිදුකර නොමැත. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සරල මාර්ග ක්‍රමය මත ක්ෂය වෙන්කළ යුතු වේ. සියලු දේපළ, පිරියත සහ උපකරණ අයිතමවල සුන්බුන් අගය ශූන්‍ය වේ යැයි උපකල්පනය කරන්න.

(iv) 2023.03.31 දින ව්‍යාපාරයේ ඉඩම් ප්‍රථම වරට රු. 6 400 000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී. මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත.

(v) 2023.03.20 දින නව නිෂ්පාදන පිරියතයක් රු. 10 000 000 කට සමාගම විසින් මිල දී ගන්නා ලද අතර, එය නිෂ්පාදන පිරියත ගිණුමට හර කර ඇත. මෙම පිරියතයේ සවිකිරීමේ පිරිවැය සහ මූලික පරීක්ෂණ පිරිවැය පිළිවෙළින් රු. 2 000 000 ක් සහ රු. 1 500 000 ක් 2023 මාර්තු මාසය තුළදී දරන ලදී. මෙම පිරිවැය අයිතම දෙකම පරිපාලන ව්‍යයම් තුළ ඇතුළත් කර ඇත. මූලික පරීක්ෂණ පිරිවැය සමන්විත වන්නේ නිෂ්පාදනය කරන ලද භාණ්ඩවල අමුද්‍රව්‍ය පිරිවැය රු. 1 000 000 කින් සහ මෘත්තිය ගාස්තු රු. 500 000 කින් ය. මූලික පරීක්ෂණයේදී නිපදවන ලද භාණ්ඩ අලෙවි ප්‍රවර්ධනය සඳහා නොමිලේ බෙදා දී ඇත. 2023.04.01 දින සිට මෙම පිරියතය භාවිතය සඳහා පවතී.

(vi) 2022.04.01 දින සමාගම විසින් එහි කාර්යාලය ලෙස භාවිත කිරීමට වසර 5 ක කාලයක් සඳහා ගොඩනැගිල්ලක භාවිත අයිතිය කල්බදු ගිවිසුමක් යටතේ ලබාගන්නා ලදී. මෙම ගොඩනැගිල්ලෙහි ඵලදායී ජීවකාලය වසර 25 කි. කල්බදු කාලසීමාව අවසානයේදී මෙම ගොඩනැගිල්ලෙහි අයිතිය සමාගමට මාරු නොවේ. 2022.04.01 දිනට කල්බදු වාරිකවල වර්තමාන වටිනාකම රු. 21 000 000 ක් විය. කල්බදු ගිවිසුමට අනුව රු. 5 000 000 බැගින් වූ සමාන වාර්ෂික වාරික 5 ක් කල්බදු කාලසීමාව තුළදී ගෙවිය යුතු අතර, පළමු වාරිකය 2023.03.31 දින ගෙවිය යුතු විය. කෙසේ වුව ද, නියමිත දින කල්බදු වාරිකය ගෙවීමට සමාගමට නොහැකි වූ අතර, එය 2023.06.30 දින ගෙවන ලදී. 2023.03.31 සහ 2024.03.31 දිනෙන් අවසන් වර්ෂ සඳහා අදාළ කල්බදු පොලිය පිළිවෙළින් රු. 1 280 000 ක් සහ රු. 1 055 000 ක් වේ. මෙම කල්බදුද සඳහා මූලික ගෙවීමක් හෝ මූලික සැපූ පිරිවැයක් නොමැති බව උපකල්පනය කරන්න. කල්බදු වාරිකවල වර්තමාන වටිනාකම භාවිත අයිතිය සහිත වත්කම් ගිණුමට හරකර, කල්බදු වගකීම් ගිණුමට බැරකර ඇත. මෙම කල්බදුද සඳහා වෙනත් කිසිදු ගිණුම්කරණ සටහනක් තබා නොමැත.

(vii) සමාගම භාණ්ඩ අලෙවිකරණ ලබන්නේ වසරක වගකීම් සහතිකයක් සහිතව වන අතර, 2023.03.31 දිනට වගකීම් සහතික සඳහා ප්‍රතිපාදනය රු. 1 150 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී වගකීම් සහතික යටතේ භාණ්ඩ අලුත්වැඩියා කිරීමට රු. 600 000 ක් වැය කරන ලද අතර, එය බෙදාහැරීමේ පිරිවැය තුළ ඇතුළත් කර ඇත.

(viii) ගේෂ පිරිත්සුමේ දක්වා ඇති ගෙවූ ආදායම් බදු සම්බන්ධිත වන්නේ පසුගිය වසර සඳහා ගෙවූ රු. 450 000 ක් සහ ප්‍රවර්තන වර්ෂයේ ප්‍රථම කාර්තු තුන සඳහා ගෙවන ලද බදුවලිනි. 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු ආදායම් බදු වගකීම් රු. 800 000 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

(ix) 2022.04.01 දිනට සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනය සම්බන්ධිත වන්නේ කොටයක් රු. 10 බැගින් නිකුත් කරන ලද සාමාන්‍ය කොටස්වලිනි. සමාගම විසින් 2022.10.01 දිනට පැවති සෑම කොටස් 5 කට 1 කොටස බැගින් වූ අනුපාතයකට කොටසක් රු. 10 බැගින් රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කරන ලදී. කෙසේ වුව ද, මේ සඳහා කිසිදු සටහනක් ගිණුම් පොත්වල තබා නොමැත. තවද, 2023.01.01 දින සමාගම විසින් රු. 10 000 000 ක් වූ මහජන කොටස් නිකුතුවක් සිදුකරන ලද අතර, එය නිවැරදිව ගිණුම්ගත කර ඇත.

(x) රු.1 500 000 ක් වූ අධ්‍යක්ෂ ගාස්තු පරිපාලන වියදම් තුළ ඇතුළත් කර ඇති අතර, සාමාන්‍ය කොටස් හිමියන්ට ගෙවූ රු. 800 000 ක අතුරු ලාභාංශ වෙනත් වියදම් තුළ ඇතුළත් කර ඇත.

අවශ්‍යවන්නේ:

'LKAS 1- මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම' ප්‍රමිතයට අනුව ප්‍රසිද්ධ කිරීම සඳහා සීමිත රුවිනි පොදු සමාගමේ පහත මූල්‍ය ප්‍රකාශන (සටහන් ද ඇතුළුව):

(1) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනය

(2) 2023.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(3) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය **(මුළු ලකුණු 40 යි)**

2. (අ) ලක්මිණි ට්‍රේඩර්ස් පොත් වෙළෙඳසැලක් පවත්වාගෙන යනු ලබයි. මෙම ව්‍යාපාරය සේවකයින් තිදෙනෙකු සේවයේ යොදවා ඇති අතර ඔවුන්ගේ 2023 දෙසැම්බර් මාසයේ වැටුප්වලට අදාළ තොරතුරු පහත දී ඇත.

සේවක අංකය	ජීවන වියදම් දීමනාව (රු.)	සේවක ණය අඩු කිරීම් (රු.)	සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේව්‍ය දායකත්වය (රු.)
001	10 000	15 000	6 000
002	10 000	—	9 000
003	10 000	10 000	7 500

අතිරේක තොරතුරු:

- EPF සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සේව්‍ය සහ සේවක දායකත්වයන් පහත පරිදි වේ.

	EPF	ETF
සේව්‍ය	12%	3%
සේවක	8%	—

- EPF සහ ETF දළ වැටුප මත ගණනය කරනු ලබයි.
- සේවකයන්ගේ දළ වැටුප සම්බන්ධිත වන්නේ මූලික වැටුපෙන් සහ දීමනාවලිනි.
- ඉහත සඳහන් දෑ හැර වෙනත් දීමනා හෝ අඩු කිරීම් හෝ නොමැත.
- යම්කිසි මාසයක, EPF සහ ETF දායකත්වයන් ඊළඟ මාසයේ පළමු සතියේදී අදාළ අරමුදල් වෙත ප්‍රේෂණය කරනු ලබයි.

අවශ්‍යවන්නේ:

2023 දෙසැම්බර් මාසය සඳහා:

(1) එක් එක් සේවකයාගේ දළ වැටුප

(2) ව්‍යාපාරයේ වැටුප් ලේඛනය

(3) පහත දෑ සටහන් කිරීමට අවශ්‍ය ජර්නල් සටහන් (*සංලක්ෂය යෙදිනවා*):

(i) වැටුප් වියදම

(ii) සේවක ණය අඩුකිරීම

(iii) EPF වගකීම

(iv) ETF වගකීම **(ලකුණු 15 යි)**

(හතරවැනි පිටුව බලන්න.

(අ) නිෂ්පාදන සමාගමක් විසින් 'P' සහ 'Q' නම් වූ භාණ්ඩ දෙකක් නිෂ්පාදනය කරනු ලබයි. මෙම භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා 'එකලස්' සහ 'නිමැවුම්' නම් වූ නිෂ්පාදන පිරිවැය මධ්‍යස්ථාන දෙක සහ 'ගබඩාව' යන සේවා පිරිවැය මධ්‍යස්ථානය මෙම සමාගම සතු වේ. මෙම සියලුම පිරිවැය මධ්‍යස්ථාන එකම ගොඩනැගිල්ලක පිහිටා ඇත.

මෙම වර්ෂය සඳහා අයවැයගත පොදුකාර්ය පිරිවැය මත පදනම්ව සමාගම විසින් දැනටම ගණනය කර ඇති පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත පහත දී ඇත.

- එකලස් පිරිවැය මධ්‍යස්ථානය - යන්ත්‍ර පැයක් සඳහා රු. 20
- නිමැවුම් පිරිවැය මධ්‍යස්ථානය - සාපු ශ්‍රම පැයක් සඳහා රු. 25

කෙසේ වුව ද මෙම අනුපාත ගණනය කිරීමේදී පහත අයවැයගත පොදුකාර්ය පිරිවැය සැලකිල්ලට ගෙන නොමැති බව පසුව අනාවරණය විය.

- ගොඩනැගිල්ලේ විදුලි පිරිවැය රු. 80 000
- ගොඩනැගිල්ලේ ක්ෂය රු. 200 000
- ගොඩනැගිල්ල සඳහා රක්ෂණ ආරිකය රු. 100 000
- එකලස් පිරිවැය මධ්‍යස්ථානයේ නඩත්තු පිරිවැය රු. 20 000

පිරිවැය මධ්‍යස්ථානවලට අදාළ තොරතුරු:

	එකලස්	නිමැවුම්	ගබඩාව
භූමි ප්‍රමාණය (චර්ග මීටර්)	6 000	3 000	1 000
කිලෝවොට් පැය	2 500	1 000	500
මුළු අයවැයගත යන්ත්‍ර පැය	40 000	12 000	—
මුළු අයවැයගත සාපු ශ්‍රම පැය	6 000	24 000	—

ගබඩාවේ මුළු පොදුකාර්ය පිරිවැය පිළිවෙළින් 3:1 අනුපාතයට එකලස් සහ නිමැවුම් පිරිවැය මධ්‍යස්ථාන අතර නැවත විභජනය කරනු ලබයි.

වර්ෂය තුළදී 'P' සහ 'Q' භාණ්ඩ නිෂ්පාදනය කිරීමට අදාළ තොරතුරු පහත දී ඇත.

	P භාණ්ඩය	Q භාණ්ඩය
ඒකකයක් සඳහා සාපු අමුද්‍රව්‍ය පිරිවැය (රු.)	216	129
ඒකකයක් සඳහා සාපු ශ්‍රම පිරිවැය (රු.) (සාපු ශ්‍රම පැයක් සඳහා වේටය රු. 100 ක් වේ.)	?	?
ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා සත්‍ය සාපු ශ්‍රම පැය:		
- එකලස්	2	1
- නිමැවුම්	1	3
ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා සත්‍ය යන්ත්‍ර පැය:		
- එකලස්	2	3
- නිමැවුම්	1	2
ඒකකයක් සඳහා නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය (රු.)	100	150

අවශ්‍යතාවන්ගෙන්:

(1) විභජන පදනම් පැහැදිලිව දක්වමින් සංශෝධිත පොදුකාර්ය පිරිවැය විශ්ලේෂණ පත්‍රිකාව

(2) එකලස් සහ නිමැවුම් පිරිවැය මධ්‍යස්ථාන සඳහා සංශෝධිත පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහන අනුපාත

(3) 'P' භාණ්ඩයේ ඒකකයක් සඳහා මුළු නිෂ්පාදන පිරිවැය සහ 'Q' භාණ්ඩයේ ඒකකයක් සඳහා මුළු පිරිවැය

(4) මුළු පිරිවැය මත 20% ක ලාභයක් පවත්වාගෙන යන්නේ නම්:

(i) 'P' භාණ්ඩ ඒකකයක විකුණුම් මිල

(ii) 'Q' භාණ්ඩ ඒකකයක විකුණුම් මිල

(ලකුණු 25 යි)

(මුළු ලකුණු 40 යි)

3. (අ) මාලා එන්ට්‍රප්‍රයිසස් කේවල ස්වාමි ව්‍යාපාරයක් වන අතර, 2023.03.31 දිනට එහි සාරාංශගත මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පහත දී ඇත.

	2023.03.31 දිනට (රු.'000)
දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම	3 000
තොගය	250
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු ඇ	400
මුදල්	40
මුළු වත්කම්	3 690
හිමිකම්	2 830
බැංකු ණය	800
වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	60
හිමිකම් හා මුළු වගකීම්	3 690

2023 අප්‍රේල් මාසය තුළදී පහත ගනුදෙනු ව්‍යාපාරයේ සිදුවිය.

අංකය	ගනුදෙනුව
1	අයිතිකරු විසින් රු. 700 000 ක් වටිනා ඉඩමක් සහ රු. 200 000 ක මුදල් අතිරේක ප්‍රාග්ධනය ලෙස ආයෝජනය කරන ලදී.
2	ලැයිස්තුගත මිල රු. 1 350 000 ක් වූ භාණ්ඩ ණයට මිල දී ගන්නා ලද අතර, මෙ සඳහා රු. 50 000 ක වෙළෙඳ වට්ටමක් ලැබුණි.
3	පිරිවැය රු. 800 000 ක් වූ භාණ්ඩ රු. 1 400 000 කට ණයට විකුණන ලදී.
4	පිරිවැය රු. 500 000 ක් වූ ලී බඩු ව්‍යාපාරයේ භාවිතය සඳහා මිල දී ගන්නා ලදී. එදිනම රු. 200 000 ක් මේ සඳහා ගෙවූ අතර, ඉතිරිය 2023 මැයි මාසයේදී ගෙවීමට එකඟ විය.
5	මාසය තුළදී මිල දී ගත් පිරිවැය රු. 20 000 ක් වූ භාණ්ඩ සැපයුම්කරු වෙත ආපසු යවන ලදී.
6	මාසය තුළදී රු. 50 000 කට විකුණූ භාණ්ඩ ණයගැතියෙකු විසින් ආපසු එවන ලදී. එම භාණ්ඩවල පිරිවැය රු. 30 000 ක් විය.
7	බැංකු ණය සඳහා රු. 70 000 ක මාසික ණය වාරිකයක් ගෙවන ලදී. මෙම වාරිකය තුළ රු. 15 000 ක පොලියක් ඇතුළත් වේ.
8	ධාරණ වටිනාකම් රු. 900 000 ක් වූ ව්‍යාපාරයේ ඉඩමක් අත්පිට මුදලට රු. 1 600 000 කට විකුණන ලදී.
9	10% ක වට්ටමක් දීමෙන් පසුව රු. 900 000 ක මුදලක් වෙළෙඳ ණයගැතියන්ගෙන් ලැබුණි.
10	පිරිවැය රු. 500 000 ක් වූ භාණ්ඩ අත්පිට මුදලට මිල දී ගන්නා ලදී.
11	පිරිවැය රු. 60 000 ක් වූ ව්‍යාපාරයේ භාණ්ඩ, අයිතිකරු විසින් ඔහුගේ පෞද්ගලික භාවිතයට ලබා ගන්නා ලදී.
12	රු. 50 000 ක වට්ටමකට යටත්ව වෙළෙඳ ණයගැතියෙකුට ගෙවිය යුතු රු. 300 000 ක් පියවන ලදී.
13	පිරිවැය රු. 100 000 ක තොගයක් විනාශ වූ අතර, රක්ෂණ සමාගම මෙම අලාභයෙන් 80% ක් ගෙවීමට එකඟ විය.
14	2023 අප්‍රේල් මාසය සඳහා මෙහෙයුම් ව්‍යදම් වූ රු. 500 000 ක් ගෙවන ලදී.
15	2023 අප්‍රේල් මාසය සඳහා දේපළ, පිරියත සහ උපකරණ මත රු. 20 000 ක ක්ෂය මෙන් කරන ලදී.

අවශ්‍යවන්නේ:

(1) 2023.04.01 දිනට ශේෂ සටහන් කර අංක 1 සිට 15 දක්වා ඇති ගනුදෙනුවල බලපෑම (අගයන් සහිතව) ශිෂ්‍යම්කරණ සමීකරණය භාවිත කරමින් පෙන්නුම් කරන්න. එක් එක් අගය ඉදිරියෙන් එය වැඩි වේ නම් (+) ද, අඩු වේ නම් (-) ද යන්න සඳහන් කරන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේදී පහත දී ඇති ආකෘතියට සමාන ආකෘතියක් භාවිත කරන්න.)

(රු.'000)

ගනුදෙනු අංකය	වත්කම් =				ණයකම් +		හිමිකම
	දේපළ, පිරියත සහ උපකරණ	තොගය	වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	මුදල්	බැංකු ණය	වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	
2023.04.01 දිනට ශේෂය							
1							
2							
....							
....							
2023.04.30 දිනට ශේෂය							

(2) ශුද්ධ වත්කම් පදනම භාවිත කරමින් 2023.04.30 දිනෙන් අවසන් මාසය සඳහා ලාභය හෝ අලාභය

(ලකුණු 30 යි)

(ආ) පාසලක ආදි ශිෂ්‍ය සංගමයක මූලික අරමුණු වන්නේ මූල්‍ය අපහසුතා ඇති සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීම ය. මෙම සංගමයට අදාළ තොරතුරු පහත දී ඇත.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය:

	2023.12.31 දිනට (රු.'000)	2023.01.01 දිනට (රු.'000)
කාර්යාල උපකරණ - ධාරණ වටිනාකම	2 750	500
ස්ථාවර තැන්පතුව	6 000	–
ලැබිය යුතු සාමාජික මුදල්	500	600
සංගීත සංදර්ශනයේ අනුග්‍රාහකයින්ගෙන් ලැබිය යුතු මුදල්	600	–
ස්ථාවර තැන්පතුවෙන් ලැබිය යුතු පොලී ආදායම	100	–
මුදල්	1 025	2 500
මුළු වත්කම්	**10 975**	**3 600**
සමුච්චිත අරමුදල	?	2 700
ශිෂ්‍යත්ව අරමුදල	?	450
කලින් ලද සාමාජික මුදල්	550	450
ශීර්ෂක සහ මුළු වගකීම	**10 975**	**3 600**

2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම:

	රු.'000	රු.'000
2023.01.01 දිනට මුදල් ශේෂය		2 500
ලැබීම්:		
සාමාජික මුදල්	1 500	
ශිෂ්‍යත්ව සඳහා පරිත්‍යාග	6 300	
සංගීත සංදර්ශනයේ ප්‍රවේශපත්‍ර අලෙවියෙන් ලැබීම්	1 100	
සංගීත සංදර්ශනය සඳහා අනුග්‍රාහකයින්ගෙන් ලද මුදල්	400	
ස්ථාවර තැන්පතුවෙන් ලද පොලිය	800	10 100
ගෙවීම්:		
ශිෂ්‍යත්ව සඳහා ගෙවීම්	1 800	
කාර්යාල වියදම්	575	
සංගීත සංදර්ශනයේ වියදම්	700	
කාර්යාල උපකරණ මිල දී ගැනීම	2 500	
2023.04.01 දින ආරම්භ කරන ලද ස්ථාවර තැන්පතුව (වසර දෙකක් සඳහා)	6 000	11 575
2023.12.31 දිනට මුදල් ශේෂය		1 025

අතිරේක තොරතුරු:

- ශිෂ්‍යත්ව ලබාදීම සඳහා වර්ෂයෙන් තුළදී ලද පරිත්‍යාග, ශිෂ්‍යත්ව අරමුදල් ගිණුමට බැර කරනු ලැබේ. වර්ෂයෙන් තුළදී ශිෂ්‍යත්ව ලබාදීම සඳහා පරිත්‍යාග භාවිත කරනු ලබන ප්‍රමාණයට සමාන වටිනාකමක් වර්ෂයේ ආදායම ලෙස හඳුනාගැනීම සංගමයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය වේ.
- වර්ෂය තුළදී කාර්යාල උපකරණ ඉවත් කිරීම් නොමැත.
- ස්ථාවර තැන්පතුවේ වාර්ෂික පොලී අනුපාතය 20% ක් වේ.

අවශ්‍යතාවන්:

(1) 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ ශිෂ්‍යත්ව අරමුදල් ගිණුම

(2) 2023.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදි ශිෂ්‍ය සංගමයේ ආදායම් ප්‍රකාශනය

(3) 2023.12.31 දිනට ආදි ශිෂ්‍ය සංගමයේ සමුච්චිත අරමුදලෙහි ශේෂය

(ලකුණු 10 යි)

(මුළු ලකුණු 40 යි)

PaperKokka.lk

4. (අ) සීමිත සුවිසු (පෞද්ගලික) සමාගම් නොග වෙළෙඳ ව්‍යාපාරයක් පවත්වාගනු ලබයි. මෙම සමාගම විසින් ණය පදනමට පමණක් භාණ්ඩ මිල දී ගනු ලබන අතර ණය පදනමට මෙන්ම අත්පිට මුදලට ද භාණ්ඩ විකුණනු ලබයි. මෙම සමාගම එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි වී ඇත.

පහත තොරතුරු 2023 දෙසැම්බර් මාසය සඳහා අදාළ වේ.

(i) සමාගමේ වත්කම් සහ වගකීම් ශේෂ:

	2023.12.31 දිනට (රු.'000)	2023.12.01 දිනට (රු.'000)
දේපළ, පිරියන සහ උපකරණ - ධාරණ වටිනාකමට	1 310	1 100
මුදල්	?	150
තොගය	300	200
වෙළෙඳ ණයගැතියෝ	?	300
වෙළෙඳ ණයහිමියෝ	?	240
VAT පාලන ගිණුම - බැර ශේෂය	?	100
උපචිත වියදම්	60	40

(ii) 2023.12.01 දිනට වෙළෙඳ ණයගැති සහ වෙළෙඳ ණයහිමි පාලන ගිණුම් ශේෂයන් එදිනට අදාළ උප ලෙජර ගිණුම් ශේෂයන්වල එකතුන් සමඟ එකඟ විය.

(iii) ණයගැති සහ ණයහිමි උප ලෙජරවලින් උපුටාගන්නා ලද 2023 දෙසැම්බර් මාසය සඳහා සමාගමේ වෙළෙඳ ණයගැතියන්ට සහ වෙළෙඳ ණයහිමියන්ට අදාළ තොරතුරු පහත පරිදි වේ.

විස්තරය	වෙළෙඳ ණයගැතියෝ (රු.'000)		
	අමල්	බිමල්	වාමර
2023.12.01 දිනට ශේෂය	100	50	150
විකුණුම් - 15% ක VAT ඇතුළත්ව	345	460	575
මුදල් ලැබීම්	350	450	500
දුන් වට්ටම්	—	25	50

විස්තරය	වෙළෙඳ ණයහිමියෝ (රු.'000)		
	නිහාල්	මාලා	තුෂාර
2023.12.01 දිනට ශේෂය	80	60	100
ගැනුම් - 15% ක VAT ඇතුළත්ව	575	690	345
මුදල් ගෙවීම්	500	600	250
ලද වට්ටම්	25	30	—

(iv) 2023 දෙසැම්බර් මාසය තුළදී සිදු වූ වෙනත් ගනුදෙනු:

- අත්පිට විකුණුම් රු. 920 000 ක් විය (*15% ක VAT ඇතුළත්ව*).
- රු. 90 000 ක ක්ෂය වියදම් ද ඇතුළත්ව මෙම මාසය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් රු. 350 000 ක් විය.
- පිරිවැය රු. 300 000 ක් වූ ලී බඩු අත්පිට මුදලට මිල දී ගන්නා ලදී (*VAT නොසලකා හරින්න*).

(v) සිදු වූ දිනයන් දක්වා නොමැති වුවත් ඉහත සියලු ගනුදෙනු දෙසැම්බර් මාසයේ විවිධ දිනයන් හි සිදු වූ බව සලකන්න.

අවශ්‍යවන්නේ:

(1) 2023 දෙසැම්බර් මාසය සඳහා පහත මූලික සටහන් පොත්:

(i) මුදල් ලැබීම් ජර්නලය (ii) මුදල් ගෙවීම් ජර්නලය

(iii) විකුණුම් ජර්නලය (iv) ගැනුම් ජර්නලය

(2) 2023 දෙසැම්බර් මාසය සඳහා පහත ලෙජර ගිණුම්:

(i) මුදල් ගිණුම

(ii) ණයගැති පාලන ගිණුම

(iii) ණයහිමි පාලන ගිණුම

(iv) VAT පාලන ගිණුම

(ලකුණු 30 යි)

(අවසාන පිටුව බලන්න.)

PaperKokka.lk

(අ) TDK ආයතනය එහි පැරණි X- කිරණ යන්ත්‍රය වෙනුවට නව X- කිරණ යන්ත්‍රයක් ආදේශනය කිරීමේ වාණිජ්‍යයක් සලකා බලමින් සිටී. මෙම නව X- කිරණ යන්ත්‍රයේ අපේක්ෂිත ඵලදායී ජීවකාලය වසර 5 කි. නව X- කිරණ යන්ත්‍රයේ තාක්ෂණික දියුණුව හේතුවෙන් සමාගමේ මෙහෙයුම් ධාරිතාව ඉහළ යෑම මෙන්ම වාර්ෂික මෙහෙයුම් පිරිවැය අඩු වීමක් ද අපේක්ෂා කෙරේ. මෙම නව යන්ත්‍රය මිල දී ගැනෙන්නේ පැරණි යන්ත්‍රය එහි වර්තමාන වෙළෙඳපොළ මිලට විකිණිය හැකි ය.

මේ සම්බන්ධයෙන් ඇස්තමේන්තුගත මුදල් ප්‍රවාහ පහත දී ඇත.

	රු.'000
පැරණි X- කිරණ යන්ත්‍රය:	
වර්තමාන වෙළෙඳපොළ මිල	2 000
ඉවත් කිරීමේ වියදම්	200
නව X- කිරණ යන්ත්‍රය:	
ගැනුම් මිල	15 000
ප්‍රවාහන සහ සවි කිරීමේ පිරිවැය	300
අතිරේක කාරක ප්‍රාග්ධන අවශ්‍යතාව (මෙම මුදල, *අපේක්ෂිත ඵලදායී ජීවකාලය අවසානයේදී අයකර ගැනීමට හැකි ය.*)	500
අපේක්ෂිත ඵලදායී ජීවකාලය අවසානයේ සුන්බුන් අගය	3 000
මුදලින් වෙවිය යුතු වාර්ෂික මෙහෙයුම් වියදම්වල ඉතුරුම්	500
වාර්ෂික අයහාරය වැඩිවීම්	3 500

මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය 10% ක් වන අතර, එහි වට්ටම් සාධක පහත පරිදි වේ.

වසර	1	2	3	4	5
වට්ටම් සාධකය (*ආසන්න දහම් ස්ථාන දෙකකට*)	0.91	0.83	0.75	0.68	0.62

අවශ්‍යවන්නේ:

(1) ව්‍යාපෘතියේ අපේක්ෂිත වාර්ෂික මුදල් ගලාඒම් සහ ගලායෑම් එක් එක් මුදල් ප්‍රවාහ අයිතම වෙන වෙනම *දක්වමින්*

(2) ව්‍යාපෘතියේ පිළිගෙවුම් කාලය (වසර)

(3) ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය (NPV)

(4) ශුද්ධ වර්තමාන අගය මත පදනම්ව නව යන්ත්‍රය මිල දී ගැනීම් සඳහා නිර්දේශය (ලකුණු 10 යි)

(මුළු ලකුණු 40 යි)

5. (අ) රාමා සහ සීතා විසින් ව්‍යාපාර උපදේශන සේවා සැපයීම් සඳහා හවුල් ව්‍යාපාරයක් 2022.04.01 දින ආරම්භ කරන ලදී.

(i) හවුල් ව්‍යාපාර ගිවිසුමේ කොන්දේසි පහත පරිදි වේ.

- **හවුල් ව්‍යාපාරයේ ලාභ හෝ අලාභ විසර්ජනය සඳහා කොන්දේසි:**

හවුල්කරුවන් සඳහා මාසික වේතන	- රාමා	රු. 50 000
	- සීතා	රු. 40 000
වර්ෂයේ ආරම්භක ප්‍රාග්ධන ශේෂය මත පොලිය		වාර්ෂිකව 10%
ලාභ හෝ අලාභ බෙදාහැරීමේ අනුපාතය		සම සමව

- **වෙනත් කොන්දේසි**

හවුල්කරුවන් විසින් ලබාදුන් ණය මත පොලිය	වාර්ෂිකව 20%

(ii) හවුල්කරුවන් විසින් ලබාදුන් ප්‍රාග්ධනයෙහි සාරාංශය සහ 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී හවුල් ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු පහත දී ඇත.

- 2022.04.01 දින හවුල්කරුවන් විසින් ලබාදුන් ප්‍රාග්ධනය:

	මුදල් (රු.'000)	ජංගම නොවන වත්කම් (රු.'000)	එකතුව (රු.'000)
රාමා	2 400	2 600	5 000
සීතා	1 800	2 200	4 000

- 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟුම් පොත්වලින් උපුටා ගන්නා ලද ආදායම් සහ වියදම්:

	රු.'000
උපදේශන සේවා ආදායම්	10 000
උපදේශන සේවා වියදම්	6 000
වෙනත් වියදම් (ක්ෂය ද ඇතුළුව)	1 000

(තවවැනි පිටුව බලන්න.

o හවුල්කරුවන් සමඟ ගනුදෙනු:

- හවුල් ව්‍යාපාරය විසින් ලබාදුන් උපදේශන සේවාවක් සඳහා රු. 100 000 ක් රාමාගේ පෞද්ගලික ගිණුමට ලැබී ඇත. තවද, මෙම උපදේශන සේවාවේ පිරිවැය වූ රු. 60 000 ක් මහනුගේ පෞද්ගලික ගිණුමෙන් ගෙවා ඇත. මෙම ගනුදෙනු සම්බන්ධයෙන් කිසිදු සටහනක් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වල තබා නොමැත.
- රාමා විසින් රු. 200 000 ක මුදලක් වර්ෂය තුළදී ගැනිලි ලෙස ලබාගන්නා ලදී.
- සීතාගේ වාර්ෂික වේතන මුදලින් නෙවා ඇති අතර එය වැඩිමසින් උපදේශන සේවා විසඳුම් ලෙස ගිණුම්ගත කර ඇත.
- රාමාට අයිති ගොඩනැඟිල්ලක් හවුල් ව්‍යාපාරය විසින් 2022.04.01 දින කුලියට ගෙන ඇති අතර, එහි මාසික කුලිය රු. 30 000 ක් විය. එම්ෂය සඳහා කුලිය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොතිබුණි. 2023.03.31 දිනට ගෙවිය යුතු පූර්ව කුලිය, මහු විසින් හවුල් ව්‍යාපාරයට ලබාදුන් අතිරේක ප්‍රාග්ධනය ලෙස සැලකීමට රාමා විසින් යෝජනා කරන ලද අතර, සීතා මේ සඳහා එකඟ විය.
- සීතා විසින් රු. 1 000 000 ක ණයක් 2022.10.01 දින හවුල් ව්‍යාපාරයට ලබාදෙන ලදී. නෙසේ වුවත් ද, මේ සඳහා පොලිය ගෙවා හෝ ගිණුම්ගත කර හෝ නොමැත.

(iii) නව හවුල්කරුවකු බඳවා ගැනීම:

2023.03.31 දින හවුල්කරුවකු ලෙස ගප්බා බඳවාගන්නා ලදී. මෙදිනට හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු. 1 800 000 ක් ලෙස ඇස්තමේන්තු කරන ලදී. ගප්බා විසින් මූහුගේ ප්‍රාග්ධනය සහ කීර්තිනාම කොටස සඳහා රු. 4 600 000 ක මුදලක් ගෙනඑන ලදී. හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් තුළින් ගළපනු ලබයි. සියලු හවුල්කරුවන් ලාභ හෝ අලාභ සම සමව බෙදාහැරීමට එකඟ විය.

අවශ්‍යවන්නේ:

(1) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශනය (හවුල්කරුවන්ට කරන ලද විසර්ජනයන් ද ඇතුළත්ව).

(2) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් සහ ජංගම ගිණුම්

(ලකුණු 25 යි)

(ආ) පහත තොරතුරු නිෂ්පාදන සමාගමක් වන සිමිත අමල් පොදු සමාගමට අදාළ වේ.

2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (රු. 'මිලියන)

අයභාරය	600
විකුණුම් පිරිවැය	360
මෙහෙයුම් වියදම්	100
පොළී වියදම	20
ආදායම් බදු වියදම	30
වසු පසු ලාභය	90

2023.03.31 දිනට (රු. මිලියන)

දේපළ, පිරියත සහ උපකරණ - ධාරණ වටිනාකම ..	300
තොගය	200
වෙළෙඳ ලැබිය යුතු ණ	150
මුදල්	100
මුළු වත්කම්	750
ප්‍රකාශිත ප්‍රාග්ධනය - සාමාන්‍ය කොටස්	300
රඳවාගත් ඉපැයුම්	100
දිගුකාලීන ණය	250
වෙළෙඳ ගෙවිය යුතු ණ	100
ගිණුම් සහ මුළු එකතුව	750

(ඉතිරිය දිගට යයිනා)

අතිරේක තොරතුරු:

- 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය තුළදී සමාගම විසින් රු. මිලියන 50 ක අතුරු ලාභාංශයක් ගෙවන ලදී.
- 2023.03.31 දිනට සාමාන්‍ය කොටස් සංඛ්‍යාව මිලියන 25 ක් විය. සමාගම විසින් ප්‍රවර්තන වර්ෂය තුළදී නව කොටස් නිකුත් කර නොතිබුණි.
- සිමින අමල් පොදු සමාගමේ නිරඟකාරී ආයතනයක් වන සිමින බිමල් පොදු සමාගමට අදාළ අනුපාත කිහිපයක් පහත දී ඇත.

– ශුද්ධ ලාභ අනුපාතය	21%
– හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය	19%
– ණය හිමිකම් අනුපාතය	65%
– කොටසක ඉපැයුම්	රු. 3.75
– කොටසක ලාභාංශ	රු. 2.50
– පොළී ආවරණ අනුපාතය	වාර 10

අවශ්‍යවන්නේ:

(1) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිමින අමල් පොදු සමාගමේ පහත අනුපාත:

(i) ශුද්ධ ලාභ අනුපාතය

(ii) හිමිකම මත ප්‍රතිලාභ අනුපාතය

(iii) ණය හිමිකම් අනුපාතය

(iv) කොටසක ඉපැයුම්

(v) කොටසක ලාභාංශ

(vi) පොළී ආවරණ අනුපාතය

(2) ඉහත (1) කොටසෙහි ගණනය කරන ලද අනුපාත, සිමින බිමල් පොදු සමාගමේ දී ඇති අනුපාත සමඟ සංසන්දනය කරමින් පහත දැ හඳුනාගන්න.

(i) විකුණුම් මත වඩා ඉහළ ප්‍රතිලාභයක් ජනනය කරන සමාගම

(ii) වඩා ඉහළ නෝලන මට්ටමක් සහිත සමාගම

(iii) සාමාන්‍ය කොටස් හිමියන්ට වඩා ඉහළ ලාභ ප්‍රමාණයක් බෙදාහරින සමාගම (ලකුණු 15 යි)

(මුළු ලකුණු 40 යි)

6. (අ) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිමින නිමාලි පොදු සමාගමේ පාරාංශගත මුදල් ගිණුම් පහත දී ඇත.

හර	මුදල් ගිණුම් (රු.'000)		බැර
2022.04.01 දිනට ශේෂය	650	ගැනුම්	2 500
විකුණුම්	3 500	වෙළෙඳ ණයහිමියෝ	5 000
වෙළෙඳ ණයගැතියෝ	4 750	මෙහෙයුම් වියදම්	1 600
බැංකු ණය	8 500	බැංකු ණය (ණය ආපසු ගෙවීම් සහ පොළිය)	3 450
කොටස් නිකුතුව	4 000	කාර්යාල උපකරණ	13 500
මෝටර් රථයක් විකිණීම	5 800	ආදායම් බදු	900
		2023.03.31 දිනට ශේෂය	250
	27 200		27 200

අතිරේක තොරතුරු:

(i) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බදු පසු ලාභය රු. 4 550 000 ක් විය.

(ii) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයට විකුණුම්, අත්පිට විකුණුම් මෙන් දෙගුණයකට සමාන වේ.

(iii) 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණයට ගැනුම් රු. 3 000 000 ක් විය.

(iv) විකුණන ලද මෝටර් රථයේ ධාරණ වටිනාකම් රු. 3 500 000 ක් විය.

(v) 2023.03.31 දිනට සහ 2022.03.31 දිනට සමාගමේ සංසන්දනාත්මක මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සහ එහි අදාළ සටහන්

	2023.03.31 දිනට (රු.'000)	2022.03.31 දිනට (රු.'000)
දේපළ, පිරියත සහ උපකරණ - ශේෂය වර්ෂාරම්භයේ	25 950	16 750
මහාරය	2 500	1 200
වෙළඳ ලැබීම් ශුද්ධ ය	?	1 650
මුදල් සහ මුදල් සමාන ය	250	650
වෙළඳ යටැබීම් ශුද්ධ ය	3 000	?
උපචිත මැනුම් ඒකක පොලිය	200	150
යටැබීම් ශුද්ධ තාවකාලික වැඩි	600	350
මැනුම් ඒකක	15 500	10 000
මූල්‍ය නීතිගත	13 300	4 750

අවසන්වන්නේ:

'LKAS 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශනය' ප්‍රමිතියට අනුව 2023.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සිමින සිහාලි සෙතු සමාගමේ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය (මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ආනි ශු මූල්‍ය ප්‍රවාහ ගෙන්නුම් කිරීමේ ක්‍රම දෙකෙ කවර හෝ එක් ක්‍රමයක් භාවිත කරන්න.) **(ලකුණු 20 යි)**

(ආ) කොළඹ සිනිවි සංචාරක ඒජන්සියක් විසින් යාපනයේ පොරාණික ස්ථාන නැරඹීමට දින තුනක වාර්තාවක් සංවිධානය කරනු ලබයි. එම වාර්තාවක් සඳහා සිටිය හැකි උපරිම සංචාරකයින් සංඛ්‍යාව 10 දෙනෙකි. එම එක් වාර්තාවකට මුළ පිරිවැය මත පදනම්ව සංචාරක ඒජන්සිය විසින් සංචාරකයින්ගෙන් ගාස්තුවක් අය කරනු ලබයි. සංචාරක ඒජන්සිය විසින් එම සංචාරයක් සඳහා සපයනු ලබන සේවාවන් පිළිබඳව සහ පිරිවැය ඇස්තමේන්තු පහත දැක්වේ.

පිරිවැය අයිතමය	ප්‍රමාණය
• කොළඹ සිට යාපනය දක්වා සහ නැවත කොළඹට ගුවන්සීට්ටුව ප්‍රවේශපත්‍ර සඳහා	එක් ප්‍රද්ගලයෙකු සඳහා රු. 7 000
• සම්පූර්ණ වාර්තාව සඳහා නවාතැන් පිරිවැය	එක් ප්‍රද්ගලයෙකු සඳහා රු. 30 000
• පොරාණික ස්ථාන නැරඹීම සඳහා වැන් රථයක් කුලියට ගැනීමේ පිරිවැය	රු. 55 000
• පොරාණික ස්ථානවලට ඇතුළත්වීමේ ගාස්තු	එක් ප්‍රද්ගලයෙකු සඳහා රු. 5 000
• සම්පූර්ණ වාර්තාව සඳහා ආහාරපාන වියදම්	එක් ප්‍රද්ගලයෙකු සඳහා රු. 10 000
• සම්පූර්ණ වාර්තාව සඳහා මාර්ගෝපදේශකයෙ ගාස්තුව	රු. 10 000
• යාපනය අවට ඇති දර්ශනීය ස්ථාන සංචාරය කිරීමට මෝටර්රථයක් කුලියට ගැනීමේ පිරිවැය	රු. 15 000
• විවිධ වියදම්	එක් ප්‍රද්ගලයෙකු සඳහා රු. 3 000

වැන් රථයේ සහ මෝටර්රථයේ මිසි ආසන ධාරිතාව 10 බැගින් වේ.

අවසන්වන්නේ:

(1) එක් වාර්තාවක් සඳහා මුළ ස්ථාවර පිරිවැය

(2) එක් ප්‍රද්ගලයෙකු සඳහා විචල්‍ය පිරිවැය

(3) සංචාරක ඒජන්සිය විසින් එක් ප්‍රද්ගලයෙකුගෙන් රු. 71 000 ක අය කරන්නේ නම් මුළ පිරිවැය ආවරණය කිරීමට වාර්තාවකට සහභාගී විය යුතු සංචාරකයින් සංඛ්‍යාව

(4) ප්‍රද්ගලයන් හතර දෙනෙකු වාර්තාවට සහභාගී වන්නේ නම්:

(i) වාර්තාවේ මුළ පිරිවැය ආවරණය කිරීම සඳහා සංචාරක ඒජන්සිය විසින් එක් ප්‍රද්ගලයෙකුගෙන් අය කළ යුතු ගාස්තුව

(ii) එක් ප්‍රද්ගලයෙකුගේ ආදායම

(iii) සංචාරක ඒජන්සිය විසින් වාර්තාවක් රු. 20 000 ක ලාභයක් අපේක්ෂා කරන්නේ නම්, එක් ප්‍රද්ගලයෙකුගෙන් අය කළ යුතු ගාස්තුව **(ලකුණු 20 යි)**

(මුළු ලකුණු 40 යි)